## සාරි පොඩිත්තක්

සාරි පොඩිත්තක් ඇඳගෙන
මාල පොඩිත්තක් බැඳගෙන
දීග පොඩිත්තක් යන්නට කතා කරාවී
කතා කරල මංගල්ලේ නියම කරාවී //

රංඩු කරල සිංදු කියල
තොරණ් ඇඳල රුහැන් බැඳල //
පාවඩ පිට මනාලයා ගෙදරට ඒවී
ගෙදර ඇවිත් ලැජ්ජාවෙන් මුකුළු කරාවී //

සාරි පොඩිත්තක් ...

තක්කිට තරිකිට කියලා
තිරික්කලේ අපි යනකොට //
අහල පහල ඉන්න ඇයො බලා ඉඳීවී
බලා ඉඳල අපි දෙන්නට විහිළු කරාවී //

සාරි පොඩිත්තක් ...

එතනො සුමනො නාඩ ඉදින්
සිකුරු තරුව පායනකන් //
ඔයාලටත් පිරිමි කෙනෙක් බැල්ම හෙලාවී
බැල්ම හෙලල තවත් ගමක් එළිය කරාවී //

*නන්දා මාලනී*